# නුවර යුගයේ සිතුවම් හා මෝස්තර පිළිබඳ අධ්‍යයනයක්

## (ශ්‍රී පරමානන්ද මහාවිහාරයේ හා තුවක්කුගලවත්ත පුරාණ විහාරයේ පුස්කොළ පොත් ආශ්‍රයෙන්)

ජේ. එම්. ලියනගේ[1]

ප්‍රාග් මානවයාගේ ගුහා සිතුවම්වලින් ආරම්භවන ශ්‍රී ලාංකීය සිතුවම්කලාව අවධි කීපයක් යටතේ සංවර්ධනය වන අතර නුවර යුගයේ දී එය විවිධ ක්ෂේත්‍ර අළලා සංවර්ධනයට පත් වේ.නුවර යුගයේ දී සිතුවම් කලාව වඩා සංවර්ධනයට හා ජනප්‍රියත්වයට පත් වීමත් සමඟ එය සම්ප්‍රදායයන් ද්විත්වයක් යටතේ සංවර්ධනය වෙමින් ව්‍යාප්ත වේ.නුවර යුගයේ උඩරට සම්ප්‍රදාය හා නුවර යුගයේ පහතරට සම්ප්‍රදාය වශයෙන් යම් යම් වෙනස්කම් සහිතව මෙය නිර්මාණය වේ. පොදුවේ බැලූ බැල්මට මෙම සම්ප්‍රදායයන් ද්විත්වය එක සමාන ලක්ෂණයන් පෙන්වුවත් සියුම්ව නිරීක්ෂණයේ දී එකිනෙකට වෙනස් කලා ලක්ෂණයන් හඳුනාගත හැකි වේ.නුවර යුගයේ දී අලංකාරය කෙරෙහිත් අවධානයන් යොමු වූ නිසා ග්‍රන්ථකරණයේ දීද මෙම සිතුවම් සම්ප්‍රදාය යොදා ගත්තේ ය. ඒ අනුව පුස්කොල පොත් නිර්මාණයේ දී එහි කම්බාව සඳහා සිතුවම් යොදා ගත් අතර එම ශිල්පීන් එහි යොදා ගත්තේ ද නුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායයි.එහි දී සම්ප්‍රදායය අනුගමනය කිරීමේ දී සිතුවම් ශිල්පියා ඒවා කුමන ආකාරයෙන් එකිනෙක හඳුනාගැනීමට හැකි ලෙස භාවිතා කර ඇත් ද හා එම යුගය නියෝජනය කරන්නා වූ පුස්කොළපොත්හි ඇති කම්බාවෙහි හා ඇතුළත නිරූපිත මොස්තරයන්හි මෙම ලක්ෂණ පවතිනවා ද යන්න ගැටලුව ලෙස ගොඩනගාගෙන පර්යේෂණය සිදු කළේ ය.

පර්යේෂණය සිදු කර ගෙන යාමේ දී ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය යන දෙකම සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ නුවර යුගයේ පහතරට හා නුවර යුගයේ උඩරට සිතුවම් සහිත විහාරස්ථානයන් වලට ගොස් ඒ පිළිබඳව අධ්‍යයනයට ලක් කළ අතරපුස්කොළපොත්වල කම්බාවන් හා තල්පත්වල ඇඳි සිතුවම් මෝස්තර අධ්‍යයනයට ලක් කළේ ය. මේ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තුවක්කුගලවත්ත පුරාණ විහාරයේ හා ශ්‍රී පරමානන්ද මහා විහාරයේ දැනට ශේෂව පවතින පුස්කොළපොත් පර්යේෂණයට බඳුන් කළේ ය.මෙම විහාරස්ථානයන් දෙක මාගේ අධ්‍යනයට ලක් කරනු ලැබුවේ ප්‍රාදේශීය වශයෙන් ඉතිහාසය ගොඩනැගීමේ දීවඩා ප්‍රයෝජනවත් වූ බැවිනි. ඒ අනුව මෙහි පවතින පුස්කොල පොත් 20 පමණ මාගේ

1 Jeewa91liyanage@gmail.com

අධ්‍යයනයට බඳුන් විය. මෙහි දී අධ්‍යයනයේ පහසුව සඳහා මා කම්බාවේ අභ්‍යන්තර මුහුණත්හි නිරූපිත සිතුවම් මෝස්තර හා කම්බාවේ බාහිර මුහුණත්හි නිරූපිත සිතුවම් හා මෝස්තර වශයෙන් කොටස් දෙකක් යටතේ අධ්‍යනයට ලක් කළේ ය. ඒ අනුව ඒවායේ ඇති සිතුවම් සඳහා භාවිත තේමාවන්, වර්ණ සංයෝජනයන්, නිර්මාණ ලක්ෂණයන්, භාවිත මෝස්තර හා අභ්‍යන්තර තල්පත්වල ඇති මෝස්තර රටාවන් අධ්‍යයනයට බඳුන් කළේ ය. ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය යටතේ සිතුවම් සම්ප්‍රදාය පිළිබඳ වූ ග්‍රන්ථ අධ්‍යයනයක් පුස්තකාල පරිශීලනය හරහා සිදු කළේ ය.

කම්බාවල සිතුවම්හි තේමාව පිළිබඳ ව අධ්‍යයනයේ දී බහුලව යොදා ගෙන තිබුණේ මල් මෝස්තර, පළාපෙති මෝස්තර, ලියවැල් හා කාන්තා රුව සහිත සිතුවම් ය. මේවා ආකාර කීපයකින් යොදා ගෙන තිබුණි. කම්බාවේ බාහිර මුහුණත්හි නිරූපිත සිතුවම් හා කම්බාවේ අභ්‍යන්තර මුහුණත්හි නිරූපිත සිතුවම් වශයෙන් වර්ග දෙකක් යටතේ අධ්‍යයනය කිරීමට හැකි විය. කම්බාවල සිතුවම්; අලංකාරය සඳහා යොදා ගත් බැවින් වැඩි වශයෙන් මල් මෝස්තර හා ලියවැල් රටාවන් පැවතුණි. නුවර යුගයේ දී පහතරට සිතුවම් කලාවේ දී උඩරට කලාවේ ශෛලිගත සම්ප්‍රදායට වඩා ලාලිත්‍යය මුසු ස්වරූපයක් හා ස්වාභාවිකත්වයට වැඩි නැඹුරුතාවයක් ලබා දුන් නිසා ලියවැල් රටා බහුලව දක්නට ලැබුණි.මල් මෝස්තරයන්වල දී අන්නාසිමල විවිධ ස්වරූපයන්වලට වෙනස් කරමින් යොදා ගෙන ඇත. පහතරට සිතුවම් ශිල්පියා ස්වාභාවිකත්වයට හා ශෛලිගත සම්ප්‍රදායෙන් වෙනස් ව ශිල්පීය දක්ෂතා පෙන්වමින් සිතුවම් දැක්වීම කළ බවට මෙම කම්බා සිතුවම් සාක්ෂි වේ. නුවර යුගයේ දී යොදා ගත් කාන්තා රූප ගලපා කළ සිතුවම් ඇතැම් කම්බාවල දක්නට ඇත. නමුත් ඒවා විහාර සිතුවම්වල මෙන් වඩාත් තාත්විකව හා සියුම් රේඛා දක්වමින් ඉදිරිපත් කර නොමැත.එහෙත් එම සිතුවම්වලින් වැඩි ලාලිත්‍යමය ස්වරූපයක් උද්දීපනය කරන්නට සිතුවම් ශිල්පියා උත්සාහ ගෙන තිබුණි. මීට අමතරව කම්බාවේ බාහිර මුහුණත්හි නිරූපිත මෝස්තර අතර මල්වැල් විය. මල් වැල් සිතුවම් කිරීමේ දී එහි නිරන්තර දක්නට ලැබුණේ නුවර යුගයේ පහතරට සිතුවම් සම්ප්‍රදායේ නිර්මාණ ලක්ෂණයන් ය. ශෛලිගත ස්වරූපයෙන් නිර්මාණය කරනවාට වඩා එය ශෛලිගත සම්ප්‍රදාය ඉක්මවා ගිය ස්වාභාවිකත්වයකින් නිර්මාණය කරන්නට උත්සාහ දැරූ බව සිතුවම්වලින් පැහැදිළි වේ. සෑම කම්බාවකම දක්නට ලැබුණු පොදු සිතුවම් කොටසක් වූයේ පළාපෙති මෝස්තරයන් ය.කම්බාවේ බාහිර මුහුණත කොටස් දෙකකට බෙදා සිතුවම් කරන්නට ශිල්පියා උත්සාහ ගෙන ඇත. ඒ අනුව කම්බාවේ මුහුණත වටා පළාපෙති මෝස්තරයක් පමණක් භාවිතා කර ඇත්තේ එහි අලංකාරය ද උද්දීපනය

වන ආකාරයෙන් සිතුවම් කරන්නට උත්සාහ ගත් බැවිනි.මෙම පලාපෙති මෝස්තරය විවිධාකාරයෙන් සිත්තම් කර තිබුණු අතර නුවර යුගයේ සම්ප්‍රදායයන් දෙකෙහි දීම භාවිතා කරන ලද පොදු ලක්ෂණයක් වශයෙන් මෙය හඳුනාගන්නා ලදී.

කම්බාවේ අභ්‍යන්තර මුහුණත් සිතුවම් කිරීමේ දී මල් වර්ග පමණක් භාවිතා කර ඇත. මල් සිත්තම් කර තිබුණේ තනි මල් වශයෙනි. විශේෂයෙන් නුවර යුගයේ දී වියන් සිතුවම් සඳහා භාවිතා වූ මල් විශේෂයන් අභ්‍යන්තර කම්බා මුහුණත් අලංකරණයේ දී භාවිතා කර තිබුණි. කම්බාවල මල් සිත්තම් කිරීමේ දී බහුලවම සීමා ඉරි දක්වමින් ඒවා දැක්වීම සිදු විය. නෙලුම් මල් මෝස්තරය බොහෝමයක් කම්බාවල සිත්තම් කර තිබුණු අතර ඒවා ඉතා සියුම් ආකාරයෙන් නිර්මාණය කර නොතිබිණි. මේවායේ නිරන්තර ඇස් නොගැටුණු නිසා ඇතැම් විට මෙසේ සිදු කළා විය යුතු ය. නමුත් පුස්කොල පොතෙහි අලංකාරය මුලික කොටගෙන කම්බාවේ අභ්‍යන්තර මුහුණත් ද මෙලෙසින් සිතුවම් කර ඇත.

වර්ණ සංයෝජනයන්වල දී රතු කහ යන වර්ණ ද්විත්වය ප්‍රධානව ම භාවිතා කර ඇත. මෙම පැහැයන් භාවිතා කිරීමේ දී අඳුරු වර්ණයන්ට මිශ්‍රිතව සිතුවම් කර තිබිණි.රතු පැහැය බොහෝ විට ගුරු පැහැයට සමාන විය.නුවර යුගයේ දී යොදා ගත් තද රතු පැහැය වෙනුවට පහතරට ශිල්පියා යොදා ගනු ලැබුයේ ඇසට වඩා අපහසු නොවුණු රතු පැහැයයි. පහන් ආලෝකයෙන් රාත්‍රී කාලයේ දී පවා නිරීක්ෂණය කළ හැකිව මෙම වර්ණයන් යෙදීමට සිතුවම් ශිල්පියා උත්සුක වී ඇති බව හඳුනාගත හැකි වේ.මෙමවර්ණ දෙකට අමතරව කලු හා කොළ පැහැය භාවිතා කර ඇත. නමුත් මෙම වර්ණයන් භාවිතා කර තිබුණේ මඳ වශයෙනි. කලු පැහැය බොහෝ විට යොදා ගෙන තිබුණේ සීමා ඉරි දැක්වීමට හෝ ඇතැම් තැනෙක සිතුවමෙහි හිස්තැන් පිරවීමට යම් රේඛාවක් දැක්වීමට ය. සිතුවම්වල පසුබිම පිළිබඳව ශිල්පියා අවධානය යොමු කර තිබුණු අතර පුස්කොල පොත්හි කම්බාව වටා දිවෙන මල් වැලක් ඒ වෙනුවෙන් භාවිතා කළේ ය. පසුබිම් පිරවීම සඳහා ශිල්පියා වෙනම උත්සාහයක් නොදැරූ අතර සිතුවම ඇඳීමේ දීම එම කාර්යය සිදු කර ඇත.

අභ්‍යන්තරයේ ඇති තල්පත්හි මෝස්තර රටා දැක්වීමේ දී බහුලව යොදා ගෙන තිබුණේ ජ්‍යාමිතික හැඩ රටාවන් ය.ජ්‍යාමිතික හැඩ රටාවන් යෙදීම, නැකැත් රාශි යෙදීම නුවර යුගයේ පහතරට සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණයක් විය. තල්පත්වල හැඩරටාවන් යෙදීමේ දී මේවා එකිනෙකට වෙනස්වන ආකාරයෙන් නිර්මාණය කර තිබුණි. එසේම ඉතා සියුම් ලෙස එය සිතුවම් කර ඇත. තල්පත්‍රය ඉරී නොයන ආකාරයෙන් ඉතා සියුම් ලෙස එය සිදු කර ඇතිවා මෙන් ම ජ්‍යාමිතික වශයෙන්

එහි වෘත්ත හා රේඛා භාවිතා කර ඇත. මේවා සෑම පුස්කොළ පොතක ම දක්නට නොලැබුණු අතර ඇතැම් ඒවායේ පමණක් දක්නට ලැබුණි. පුස්කොළ පොතෙහි මුල හා අග වශයෙන් මෙම ජ්‍යාමිතික මෝස්තරයන් සිතුවම් කර තිබිණ.

යථෝක්ත පර්යේෂණය සිදු කිරීමේ අරමුණ වූයේ නුවර යුගයේ සිතුවම් කලාව විහිදී ගියා වූ එක් ක්ෂේත්‍රයක් පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ඒ අනුව පුස්කොළ පොත් යන ක්ෂේත්‍රය තෝරා ගත් අතර එහි දී නිගමනය කළ හැකි වූයේ මෙම සිතුවම්වල නුවර යුගයේ සිතුවම් ශිල්පයට අයත් ශිල්පීය ලක්ෂණයන් ඇති බවයි. එහි දී නුවර යුගයේ උඩරට සම්ප්‍රදායට වඩා සිතුවම් ශිලපීන් අනුගමනය කර තිබුණේ නුවර යුගයේ පහතරට සිතුවම් සම්ප්‍රදායයි. තත්කාලීන සමාජයීය පසුබිම තුළ ඔවුන් වැඩි වශයෙන් එම සිතුවම්වලට නැඹුරු වී ඇති බව හඳුනාගන්නට හැකි විය. ඒ අනුව නුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායේ මූලික ලක්ෂණයන් මෙම පුස්කොල පොත්හි කම්බාවේ ඇඳි සිතුවම්වල පවතින බව තහවුරු විය.

ප්‍රමුඛ පදඃ සිතුවම්සම්ප්‍රදාය , නුවර යුගය, කම්බාව, පුස්කොල පොත්

**ආශ්‍රිත ග්‍රන්ථ**

ධර්මබන්ධු, සනත්. (2008). *චිත්‍ර හා මූර්ති කලාව*. කොළඹඃ ගුණසේන සහ සමාගම.

පෙරේරා, ලාල්. (2007). *චිත්‍ර කලාව*, වරකාපොළඃ හෙළදිව ප්‍රකාශකයෝ.

කුමාරස්වාමි, ආනන්ද. (1962). *මධ්‍ය කාලීන සිංහල කලා*.සෙනෙවිරත්න, එච්. එම්. (පරි.) කොළඹඃ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.